# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.11.07 පැය 0535 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/ 2003/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු**

### 01. සැකකටයුතු මරණයක් - අඟුරුවාතොට පොලිස් වසම.

2025.11.06 වන දින දහවල් කාලයේ අඟුරුවාතොට පොලිස් වසමේ වතුගොඩ ප්‍රදේශයේ වෙල්යායක පුද්ගලයෙකු මියගොස් සිටින බවට අඟුරුවාතොට පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ උඩුවර, අඟුරුවාතොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරුගේ නාසයෙන් රුධිරය වහනය වීමක් සිදුව ඇති අතර මෙය සැකකටයුතු මරණයක් ලෙස නිරීක්ෂණය වන බැවින් මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු මෘත ශරීරය පශ්චාත් මරණ පරික්ෂණය සඳහා හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අඟුරුවාතොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. හදිසි අනතුරකින් පුද්ගලයෙකු මියයාම - ගලහ පොලිස් වසම.

2025.11.06 වන දින සවස් කාලයේ ගලහ පොලිස් වසමේ හාල්වත්ත ප්‍රදේශයේදී මහනුවර සිට දෙල්තොට දක්වා ගමන් කල ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථයක් මතට ගසක් කඩා වැටීම හේතුවෙන් එහි ගමන් ගත් කාන්තාවන් 06 දෙනෙකු හා පිරිමි පුද්ගලයින් 05 දෙනෙකු තුවාල ලබා ගලහ රෝහලට ඇතුලත් කිරීමේදී එක් මගී පුද්ගලයෙකු මියගොස් ඇත. තුවාලකරුවන් 04 දෙනෙකු වැඩිදුර ප්‍රතිකාර සඳහා මහනුවර මහ රෝහල වෙත මාරු කර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 60 ක් වූ කිලිනොච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගලහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ගලහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. මාරක රිය අනතුරක් - කනගරායන්කුලම් පොලිස් වසම.

2025.11.07 වන අද දින අළුයම් කාලයේ කනගරායන්කුලම් පොලිස් වසමේ මහනුවර යාපනය මාර්ගයේ පෙරියකුලම් ප්‍රදේශයේදී යාපනය දෙස සිට වව්නියාව දෙසට ධාවනය වූ ලොරි රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ත්‍රීරෝද රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු හා එහි පිටුපස ගමන් කල මගී පුද්ගලයෙකු තුවාල ලබා මාන්කුලම් රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කිලිනොච්චිය

රෝහලට මාරු කර යවා සිටියදී ත්‍රීරෝද රථයේ පිටුපස ගමන් කල මගී පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 25 ක් වූ යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කිළිනොච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කනගරායන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**